## පළමුවන කියැවීම

හිතෝපදේශය 9:1-4

හිතෝපදේශයෙන් ගත් පාඨයෙකි.

**මාගේ බොදුන් අනුභව කොට, රස කැවූ මිදිරස පානය කරන්න.**

ප්‍රඥාව ඇගේ මන්දිරය ඉදිකර ඇත. එහි කුළුණු සතක් සාදා ඇත. සතුන්ගේ මසින් ද රස කැවූ මිදිරසයෙන් ද ඇගේ මහල් මේසය පිළියෙල කොට ඇත. තමන් පිටත් කර යැවූ සේවිකාවන් ලවා. නගරයේ ඉහළම තැන සිට ඈ මෙසේ ආරාධනා කරන්නී ය: අනුවණ ජනතාවෙනි, මෙහි පිවිසෙන්න." මෝඩ මිනිසුන්ට ඈ මෙසේ කියන්නී ය: "එන්න, මාගේ බොදුන් අනුභව කොට, රස කැවූ මිදිරස පානය කරන්න. අනුවණකම හැර දමා ජීවත් වන්න. නැණ නුවණ මාවතෙහි ගමන් කරන්න."

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 34:1-2,9-14

පිළිතුර: හිමි තුමන් ගුණවත් බව අත්දැකීමෙන් දැනගන්න.

ගීය: හැම වේලේ ම හිමි තුමන්ට මම ප්‍රශස්ති ගී ගයමි. එතුමන්ගේ ගුණ වැනුම් මා මුවින් තොර නොවෙයි. මම එතුමන්ගේ ගුණ වර්ණනා කරමි. නිහතමානි අය ඒ අසා සතුටු වෙත්වා.

එතුමන්ගේ සැදැහැවතුනි, එතුමන්ට ගරු බිය දක්වන්න. මන්ද, දේව ගරු බිය ඇති අයට අග හිඟයක් නැත. ධනපතීහු පවා කෑම නැතිව සාගින්නෙන් පෙළෙති. එහෙත් හිමි තුමන් සරණ යන අයට යහපත් දෙයින් කිසි අඩුවක් නැත.

දරුවෙනි, මට සවන් දෙන්න. සමිඳුන්ට ගරු කිරීමට මම ඔබට උගන්වන්නෙමි. සැප ජීවිතය භුක්ති විඳීමට යම් කෙනෙක් කැමති ද? දීඝායු වළඳ සුවසම්පත් රස විඳීමට කැමති ද? එසේ නම් නපුරු කතාවෙන් ද මුසාවාදයෙන් ද වැළකී සිටිය යුතු ය. නපුර හැරදමා යහපත කරන්න. සාමය සොයා ඒ අනුව යන්න.

## දෙවන කියැවීම

එපේසි 5:15-20

ශුද්ධ වූ පාවුලු අපෝස්තුළු තුමන් විසින් එපේසිවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

**"ස්වාමින් වහන්සේගේ කැමැත්ත කිමෙන් ද කියා තේරුම් ගන්න."**

එබැවින් ඔබ ජීවත් වන පිළිවෙළ ගැන ඉතා සැළකිලිමත් වන්න. අඥානයන් මෙන් නොව ඥානවන්තයන් මෙන් ජීවත් වන්න. කාලය නපුරු බැවින් ඇති හැම අවස්ථාවකින්ම ප්‍රයෝජන ගන්න. එබැවින් අනුවණයන් නොවී සමිඳාණන් වහන්සේගේ කැමැත්ත කිමෙන් ද කියා තේරුම් ගන්න. මුද්‍රික පානයෙන් මත් නොවන්න. එයින්

අනාචාරකම් හට ගන්නේ ය. ඒ වෙනුවට ආත්මයාණන්ගෙන් පූර්ණ වන්න. ගීතිකා තුති ගී හා ශුද්ධ ගී එකිනෙකාට ගයන්න. ඔබ හදවත් තුළ තුති නද දෙමින් සමිඳුන්ට ගී ගයන්න. අපගේ සමිඳාණන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන්, දෙවි පියාණන් වහන්සේට සැමවිට ම සැම දේ ගැනම ස්තුති කරන්න.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සාධුකාරය

ජුවාම් 1:14,12

ආලේලූයා! ආලේලූයා!
ධර්මයාණෝ මිනිසත් බව රැගෙන අප අතර වැඩ විසූ සේක.
උන් වහන්සේ පිළිගත් සියල්ලන්ට දෙවියන් වහන්සේගේ දරුවන් ලෙස
උපත ලැබීමේ වරම උන් වහන්සේ දෙවා වදාළ සේක.
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

ජුවාම් 6:51-58

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**"මාගේ මාංශය සැබෑ භෝජනය වේ; මාගේ රුධිරය සැබෑ පානය වේ."**

ස්වර්ගයෙන් පහළ වන ජීවනදායක භෝජනය මමය. යමෙක් මේ භෝජනයෙන් වැළඳුවොත්, ඔහු සදාකල් ජීවත් වන්නේය. මා විසින් දෙනු ලබන ඒ භෝජනය මාගේ මාංශය වේ. මා එය දෙන්නේ ලෝකයාගේ ජීවනය පිණිස ය"යි ජේසුස් වහන්සේ ජුදෙව්වරුන්ට වදාළ සේක. එවිට ජුදෙව්වරු ඔවුනොවුන් අතර විවාද කරමින්, "මේ මිනිසා, ඔහුගේ මාංශය අනුභව කරන පිණිස අපට දෙන්නේ කෙසේද"යි කීහ. එබැවින් ජේසුස් වහන්සේ ඔවුන් මෙසේ ඇමතූ සේක; "ඒකාන්තයෙන් මම ඔබට කියමි, ඔබ මනුෂ්‍ය - පුත්‍රයාණන්ගේ මාංශය අනුභව නොකරන්නහු නම්, ඔහුගේ රුධිරය පානය නොකරන්නහු නම්, ඔබ තුළ ජීවනය නැත. යමෙක් මාගේ මාංශය අනුභව කරන්නේ ද, මාගේ රුධිරය පානය කරන්නේ ද, ඔහුට සදාතන ජීවනය ඇත. තවද, මම ඔහු අන්තිම දවසේදී උත්ථාන කරන්නෙමි. මන්ද, මාගේ මාංශය සැබෑ භෝජනය වේ; මාගේ රුධිරය සැබෑ පානය වේ. මාගේ මාංශය අනුභව කරන, මාගේ රුධිරය පානය කරන තැනැත්තේ මා තුළ ජීවත් වන්නේය; මම ද ඔහු තුළ ජීවත් වන්නෙමි. ජීවමාන පියාණන් වහන්සේ මා එවා වදාළ බැවින්, මා පියාණන් වහන්සේ නිසා ජීවත් වන ලෙසම, මා අනුභව කරන තැනැත්තේ, මා නිසා ජීවත් වෙයි. මේ වනාහි ස්වර්ගයෙන් පහළ වූ භෝජනය වේ. එය අපේ පියවරුන් වැළඳූ ආහාර මෙන් නොවේ. ඒ ආහාරය වැළඳූ ඔව්හු මළහ. එහෙත්, මේ භෝජනය වළඳන තැනැත්තේ සදහටම ජීවත් වන්නේය."

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.